# Abstract No 86

## ගිනිකොණ දිශාව පිළිබඳ වාස්තුවිද්‍යානුකූල විග්‍රහය

**විරාජ් සූරියබණ්ඩාර**
ආරාධිත කථිකාචාර්ය, සංස්කෘත අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය
virajsoori@gmail.com

නැගෙනහිර දිශාවෙන් අංශක 22.5 වම් පැත්තට ද, දකුණු දිශාවෙන් අංශක 22.5 දකුණු පැත්තට ද අයත් වන අංශක 45ක කෝණ ප්‍රදේශය ගිණිකොණ දිශාව ලෙස හඳුන්වයි. ජෝතීර්විද්‍යාවට අනුව ගිණිකොණ දිශාවට අයත් දෙවියා අග්නි දෙවියා ය. තව ද ගිණිකොණ දිශාවට අයත් ග්‍රහයා සිකුරු ග්‍රහයා ය. ඒ නිසා ගිණිකොණ දිශාව ශුභ දිශාවක් ලෙස නො සලකයි. මිනිස් ශරීරය හා මුළු විශ්වය ම නිර්මාණය වී ඇත්තේ පංච මහාභූතයන්ගෙන්ය. යහපත් ප්‍රතිඵලයක් ලබා ගැනීමට නම් මෙම පංච මහාභූතයින් ස්වභාවික ව සංතුලිත විය යුතු ය. කිසියම් ධාතුවකින් තවත් ධාතුවකට පරිණාමය සිදු වන්නේ අවකාශ (කාලය) තත්ත්වය හරහා ය. නිදර්ශනයක් ලෙස කිසියම් ගසක් වැඩීමට පංචමහා භූතයින්ගේ දායකත්වය අවශ්‍ය වන අතර ජලය, තාපය, වාතය, පස ගසේ වැඩීමට අවශ්‍ය අවකාශය වේ. ඒ අනුව තේජෝ භූතය හෙවත් අග්නි ශක්තිය ගිණිකොණ දිශාව නිරූපණය කරයි. ගිණිකොන දිශාවෙහි මුළුතැන්ගෙය නිර්මාණය කිරීම වෙනුවට ප්‍රධාන නිදන කාමරය යොදා තිබීම වර්තමානයේ බහුල ව දක්නට ලැබේ. ගිණිකොණ දිශාවෙහි ප්‍රධාන නිදන කාමරය පිහිටා තිබෙන විට විශ්වයේ ගිණිකොන දිශාවෙහි නිකුත් වන්නා වූ ගිණිකාරක ශක්තිය එම නිවසේ ජීවත් වන්නේ නව විවාහ වූ යුවලක් නම් ඔවුන්ගේ දරුවන් ලැබීමේ කාර්යය සඳහා මෙහි බලපෑමක් සිදුවිය හැකි ය. නිවාස දහස් ගණනක් තුළ කරන ලද පර්යේෂණවලට අනුව දරුවකු ගබ්සා වීම් එසේත් නොමැති නම් දරුවන් පිළිසිඳ නොගැනිම් සඳහා මෙම ගිණිකොන දිශාව ඍජුව ම බලපායි. ඇතැම් අවස්ථාවල අධ්‍යාපනය ලබන්නා වූ දරුවෙක් මෙම ගිණිකොන දිශාවේ කාමරයක සිටිනවා නම් ඔහුගේ මනස කලබලකාරී තත්වයක් හා පාඩම් කළත් මනසේ නොරැඳෙන තත්ත්වයක් එසේත් නොමැති නම් එක තැන සිට පාඩම් කිරිමට නොහැකි තත්ත්වයක් ඇතිවිය හැකි ය. සමහර විට මවට හා පියාට කීකරු නැති අකීකරු දරුවන් සඳහා ද මෙම ගිණිකොණ දිශාවෙහි නිදන කාමර තිබීම හේතු විය හැකි ය. ඇතැම්විට ගිණිකොණ දිශාවේ කාමරයක සිටින අයගේ ශරීරයේ රක්තයා කිපී උෂ්ණාධික රෝග කිසියම් වූ අසමතුලිතතාවන්, හන්දියක් අමාරු සුවපත් නොවන ශාරීරික අමාරුකම් වැනි රෝග ලක්ෂණ මෙම ගිණිකොණ දිශාවේ කාමරවල සිටින අයට ඇතිවිය හැකි ය. ආධ්‍යාත්මික ජීවිතයක් ගත කරන බණ භාවනා කරන අය සිටියහොත් ඒ අයට මනස සන්සුන් කරන කාර්යය මෙම ගිණිකොණ දිශාවේ සිටීමෙන් ඉතාමත් අමාරු කාර්යයක් වේ. ඉහත කරුණුවලට අනුව ගිණිකොණ දිශාවේ වඩාත් උචිත ගෘහ අංගය වනුයේ මුළුතැන්ගෙය යි. ඇතැම් නිවාසවල ගිණිකොණ දිශාවේ ජලය ආශ්‍රිත කටයුතු නිදර්ශන ලෙස වැසිකිළි, ජල ටැංකි, ළිං, පොකුණු පිහිටුවා තිබෙන අයුරු දැකිය හැකි ය. මෙලෙස පිහිටුවීම තුළින් විශ්වයෙන් නිකුත්වන ගිණිකාරක ශක්තිය හා ජල ශක්තිය අතර ඇතිවන විපර්යාස හේතුකොට ගෙන මෙම ශක්තීන් විකෘති වීමට භාජනය විය හැකි ය.

**ප්‍රමුඛපදඃ-** ජ්‍යොතිර් විද්‍යාව, ගිණිකොණ, මහාභූත, ගිනිහල්ගෙය, දරුවන්